Prepared by- එච්. ආර්. ප්‍රදීප් කුමාර

# ව්‍යාපාර පරිසරය

01. ව්‍යාපාර පරිසරය යනුවෙන් කුමක් අදහස්වේද?

02. ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් සාධක 3 ක් හා බාහිර පරිසරයට අයත් සාධක 4 ක් නම් කරන්න.

03. ව්‍යාපාර අභ්‍යන්තර පරිසර සාධකයක් වන කළමනාකරුවෝ යන අය නිර්වචනය කරන්න

04. කිතුල්ගල ප්‍රදේශය කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා සුදුසු භෞතික සම්පත් ඇති ප්‍රදේශයකි. මෙම ප්‍රදේශයේ ජීවත් වන කුසුම්සිරි කිතුල් හකුරු, පිටි හා කිතුල් පැණි නිෂ්පාදනය සඳහා දක්ෂතාවක් දක්වන පුද්ගලයෙකි. මෙම කර්මාන්තය තව දුරටත් වර්ධනය කිරීම සඳහා බැංකු හා මූල්‍ය ආයතන ණය දීමටද එකගතාව පළ කර සිටි. මෙම සිද්ධියට අනුව,

   I. ශක්තියක් සඳහන් කරන්න.

   II. බාහිර පරිසර සාධකයක් ලියන්න

05. ආර්ථික පරිසරයේ සාධක 4ක් නම් කර ඒවා එකිනෙක කෙටියෙන් විස්තර කරන්න.

06. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයේ සිදුවන හිතකර බලපෑම් දෙකක් හා අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

07. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

   I. ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් නෛතික පරිසරය හා ගෝලීය පරිසරය ලෙස වරග කල හැකිය.

   II. ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම ව්‍යාපාරයකට ශක්තියකි.

   III. ව්‍යාපාරක අයිතිකරුවන් අභ්‍යන්තර පරිසර සාධකයක් වන අතර ගණුදෙනුකරුවන් බාහිර පරිසර සාධකයක් වේ.

   iv ව්‍යාපාර කටයුතු මෙහෙයවීමට අදාළ තීරණ ගනු ලබන්නේ කළමනාකරුවන් විසිනි.

08. ව්‍යාපාරයක දැකිය හැකි ශක්තීන් හා දුර්වලතා සඳහා නිදසුන් දෙකක බැගින්ද, ව්‍යාපාරයකට ඇති අවස්ථා හා තර්ජන සඳහා ද නිදසුන් දෙක බැගින් ලියන්න.